# ලංසු ආරාධනය

**ශ්‍රී ලංකා මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා නිකුත් කිරීමේ පද්ධතිය සහ ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය සඳහා අදාළ Public Key Infrastructure (PKI) යටිතල පහසුකම් සංරචක ප්‍රසම්පාදනය**

**IFB අංකය : DIE/PRO/PKI/2025**

1. **ආගමන හා විගමන දෙපාර්තමේන්තුව** වෙනුවෙන් ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ (HLPC), සභාපති විසින් **ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා නිකුත් කිරීමේ පද්ධතිය සහ ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය සඳහා අදාළ Public Key Infrastructure (PKI) යටිතල පහසුකම් සංරචක ප්‍රසම්පාදනය** සඳහා යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි විශේෂයෙන් දක්වා ඇති අන්තර්ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය (**ICB** - තනි අදියරේ කවර දෙකේ ලංසුකරණ ක්‍රියාපරිපාටිය) යටතේ පැවැත්වෙනු ඇති අතර මාර්ගෝපදේශයන්හි අර්ථ දක්වා ඇති යෝග්‍යතා පූර්ණ සියළු ලංසුකරුවන් සඳහා විවෘතව පවතී.

   කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීම සඳහා, සාර්ථක ලංසුකරු අසාදු ලේඛනගත වී නොසිටිය යුතුය. යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් සඳහා වන සුදුසුකම් නිර්ණායකවලට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය. (අතිරේක සුදුසුකම් අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇත.):

   **අ) සාමාන්‍ය පළපුරුද්ද.**

   ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයට පෙර ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය සහ නිකුත් කිරීමේ විසඳුම ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලංසුකරුට තිබිය යුතුය.

   **ආ) සමාන ස්වභාවයේ කොන්ත්‍රාත්තුවේ සුවිශේෂී පළපුරුද්ද:**

   i. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයට පෙර අවම වශයෙන් පසුගිය අවුරුදු පහ (05) තුළ කොන්ත්‍රාත්කරුවෙකුගේ භූමිකාව තුළ පද්ධතිය භාවිතා කරමින් අවම වශයෙන් ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර මිලියන තුනක් (3) වත් නිකුත් කරමින් ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය සහ නිකුත් කිරීමේ විසඳුමක් ක්‍රියාත්මක කිරීම ලංසුකරු විසින් සපුරා තිබිය යුතුය.

   ii. ලංසුකරු යොමු ලිපි මගින් තහවුරු කෙරෙන ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය කිරීමේ විසඳුම් දෙකක් අවම වශයෙන් ලංසුකරු විසින් ලබා දී හෝ ක්‍රියාත්මක කර හෝ තිබිය යුතුය. එක් එක් ව්‍යාපෘතියේ අවම වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන පහළොවකට (15) ට නොඅඩු විය යුතු අතර, ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයට පෙර පසුගිය වසර පහ (05) තුළ ව්‍යාපෘති සම්පූර්ණ කර හෝ ක්‍රියාත්මක වී තිබිය යුතුය. මෙම ව්‍යාපෘතිවලින් අවම වශයෙන් එකක්වත් (01) PKI විසඳුමක් ඇතුළුව ලංසුකරු විසින් ක්‍රියාත්මක කරන ලද නිකුත් කිරීමේ සේවා ව්‍යාපෘතියක් විය යුතුය.

   **ඇ) ගුණාත්මකභාවය සහ ආරක්ෂක අවශ්‍යතා:**

   ISO 9001:2015 සහ ISO 27001 වෙතින් ලංසුකරු සහතික කර තිබිය යුතුය.

   **ඈ) සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම:**

පසුගිය වසර තුන (3) තුළ විගණනය කරන ලද මූල්‍ය වාර්තාවන් මගින් සනාථ වන පරිදි, ඇමරිකානු ඩොලර් මිලියන දහයක (10) අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් ලංසුකරු සතු විය යුතුය.

ඉ) මූල්‍ය සම්පත්:

මෙම ව්‍යාපෘතිය සඳහා ලංසුකරුගේ පවත්නා අනෙකුත් බැඳීම්වලින් තොරව ඇමරිකානු ඩොලර් මිලියන 1.8 ට නොඅඩු මුදල් ප්‍රවාහ අවශ්‍යතාව සපුරාලීම සඳහා ද්‍රවශීල වත්කම්, ණයවර මාලා හෝ වෙනත් මූල්‍ය ක්‍රම වැනි මූල්‍ය සම්පත් වෙත ප්‍රවේශය හෝ පැවතීම ලංසුකරු විසින් පෙන්නුම් කළ යුතුය.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", **ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ,** 05 වන මහලේ **නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන)** වෙතින් හෝ dcprocu@immigration.gov.lk දරන විද්‍යුත් ලිපිනයෙන් හෝ +94112101559 දරන දුරකතන අංකය අමතා ලබා ගත හැකි අතර ඉහත සඳහන් ව ඇති ලිපිනයේ දී 2025 අප්‍රේල් 28 දින සිට සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලසීමාවේදී නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක. මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ වෙබ් අඩවිය වන www.pubsec.gov.lk සහ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන **www.immigration.gov.lk** යෙහි **පරිශීලනය කිරීම සඳහා පමණක්** ලංසු ලිපිලේඛන ප්‍රසිද්ධ කර ඇත.

4. **රුපියල් 250,000.00 ක් හෝ ශ්‍රී ලංකාවේදී පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් ඒ හා සමාන** ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ව්‍යාපාරික ලිපි ශීර්ෂයක ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් **ආගමන හා විගමන දෙපාර්තමේන්තු** කාර්යාලයෙන් (ඉහත 3 ඡේදයේ සඳහන් ලිපිනයේදී) මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

5. ලංසු, **2025 ජුනි 23 වන දින ප.ව. 3.00** ට **හෝ ඊට පෙර** (ඉහත 3 ඡේදයේ) ලිපිනයට භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවා අවසන් වූ වහාම, **2025 ජුනි 23 වන දින ප.ව. 3.00** ට සහභාගී වීමට තෝරා ගන්නා ලද ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ. **ශ්‍රී ලංකා රුපියල් මිලියන පනස් පහකට (ලංකා රුපියල් මිලියන 55)** නොඅඩු **හෝ ශ්‍රී ලංකාවේදී පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් ඒ හා සමාන මුදලක** බැංකු ඇපකරයක් සියලුම ලංසු සමඟ එවිය යුතුය.

6. **2025** මැයි මස **15** වෙනි දින පෙ.ව.**10.30** ට **ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", 17 වන මහලේ මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී** පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන්ට මෙම පූර්ව ලංසු රැස්වීමට සහභාගී විය හැකිය.

**සභාපති,**
ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව (HLPC),
05 වැනි මහල,
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
"සුහුරුපාය",
ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.
2025 අප්‍රේල් 27